# අපේ වී ගොවිතැනේ තවත් පෙරළියක්

ඉඩම්, ජලය ආදී අපේ සීමිත ධන සම්පත් තුළින් උපරිම අස්වැන්නක් ලබාගැනුම සඳහා නව ගොවිතැන් ක්‍රම උපයෝගි කර ගත යුතු වන්නේය. ඒ සඳහා අපේ ගතානුගතික ගොවිතැන් ක්‍රම වල ඇති අඩුලුහුඩු තැන් සොයා බැලීමටත් ඒ වෙනුවට අළුත් ක්‍රම සොයා ගැනීමටත් කෘෂිකාර්මිකයන් දරනුයේ ඉමහත් වෙහෙසකි. කාලයක් මුළුල්ලේ පැවති ගොවිතැන් ක්‍රමයක දුර්වලතාවයන් මගහරවමින් ප්‍රදේශයට හා පරිසරයට උචිත පරිදි සොයාගත් එවැනි නව ගොවිතැන් ක්‍රමයක් පිළිබඳව වාර්තා කරනු කැමැත්තෙමු.

වාරිමාර්ග පහසුකම් නොමැති වැසි ජලයෙන් පමණක් වී ගොවිතැන් කරන පෙදෙස් සඳහා ඉතාමත් ප්‍රයෝජනවත් වූ මේ ක්‍රමය පිළිබඳ මුලින්ම අදහස් පහළ වූයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා සංස්කරණ අභ්‍යාස මධ්‍යස්ථානය භාර කෘෂිකර්ම නිලධාරි ඩී. ඩබ්ලිව්. සිරිනායක මහතාටය. වැසි ජලයෙන් වී ගොවිතැන මෙන්ම ඒ අතර වෙනත් වගා වන්ද කිරීම පිළිබඳව මෙතෙක් කල් පැවති අවිශ්වාසදායක තත්ත්වය හා ගතානුගතික අදහස් ද දුරුකරමින් මෙරට අත්දැකීම් හා විදේශීය පුහුණුවද උපයෝගී කරගත් ඒ මහතා මෙම නව ගොවිතැන් ක්‍රමය අත්හදා බැලීම සඳහා කුරුණෑගල හා මාතලේ දිස්ත්‍රික් දෙක තෝරා ගත්තේය.

ඒ අනුව, කුරුණෑගල දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි වී. අබේවර්ණ හා මාතලේ දි. කෘ. ව්‍යා. නි., සී. බී. අළුවිහාරේ යන මහතුන්ගේ සහයෝගිත්වය හා එකඟත්වය අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිකම් උපදේශක කොට්ඨාශ 10 කින් ගොවීන් 20 ක් හා මාතලේ දිස්ත්‍රික්කයේ ගො. උ. කොට්ඨාශ 4 කින් ගොවීන් 6 දෙනෙක්ද තෝරා ගන්නා ලදී. 1972 සැප්තැම්බර් 28, 29 හා 30 යන තෙදින තුළ එම ගොවි මහතුන්ටත් එම කොට්ඨාශ භාර ගොවිකම් උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවක මහතුන් සඳහාත් මෙම නව ක්‍රමය පිළිබඳ මූලික පුහුණුවක් ලබා දෙන ලදී. ඉන් පසුව සිය කැමැත්තෙන්ම ඉදිරිපත් වූ ගොවීන් විසින් මෙම වැඩපිළිවෙල අරඹා ඇති අතර, ඉතාමත් සාර්ථක ලෙස එම වැඩපිළිවෙල දැනට ක්‍රියාත්මකවේ.

මෙම ක්‍රමයේ ප්‍රධාන අරමුණු කීපයකි. වාරිමාර්ග පහසුකම් රහිත වැසි ජලයෙන් පමණක් වී වගා කෙරෙන කුඹුරුවල, වී මෙන්ම වෙනත් භෝග වර්ගද හැකි තරම් වගා කිරීමෙන් ඉඩම් ඒකකයකින් උපරිම නිෂ්පාදනයක් හා ආදායමක් ලබාගැනීම ප්‍රධාන පරමාර්ථයයි. මෑතක් වන තෙක් මෙම පෙදෙස් වල ගොවි මහතුන් පුරුදුව සිටියේ කුඹුරේ වැඩ ඇරඹීම සඳහා හොඳින් වැසි ලැබ වැවේ වතුර පිරෙන තෙක් බලා සිටීමයි. බොහෝ කාලයක් තිස්සේ පැවති මේ ක්‍රමය නිසා, මාස 4 ක් වයස් වී වර්ග සඳහා ජලය සැපයීම අපහසුවූයේ නම්, ගොයමට හානි වීමටද ඉඩ තිබුණි. ඒ අතර, බුසල් 40 කට වඩා ගතහැකි අඩු වයස් වී වර්ගද මුලදී නොතිබුණු හෙයින් මාස 4 ට අඩු වයසැති වර්ග වගා කිරීමටද ගොවීන් පෙළඹුනේ නැත. එහෙත් දැනට බුසල් 100 කට වඩා ගත හැකි මාස 3 වී වර්ග ඇති හෙයින් මාස 4 වර්ග වගා කිරීමේ බලාපොරොත්තුවෙන් සිටීම අවශ්‍ය නැත. මේ ක්‍රමය අනුව නොවැම්බර් වර්ෂාවත් සමග වී වැපිරුවහොත් මාස 2 ක්ම වැසි ජලයෙන් නඩත්තු කර, ඉන්පසු ජලය හිඟ වුවොත් වැවෙන් ලබා ගැනීමට හෝ ඉතිරි ජලය වැවේ ගබඩා කර තැබීමට පුළුවන. මෙම ජලය වෙන වගාවක් සඳහා යොදා ගැනීමට ඉන් අවස්ථාව සැලසෙයි. ඊළඟ වගාව අප්‍රේල් වැසි බලාපොරොත්තුවෙන් හෝ වැසි නොලැබුනහොත් වැවේ වතුරින් හෝ කළ හැකිය. ඉන්පසු වගා කන්න අතර, මුංඇට, කව්පි වැනි කෙටිකාලීන භෝගයක් වගාකළ හැකිය. වැසි ජලයෙන් නිසි ප්‍රයෝජන ගන්නා අතර එමගින් සාර්ථක ලෙස කන්න දෙකක් වී වගාව කිරීමටත්, තවත් භෝගයක් අතිරේක වශයෙන් වගා කිරීමටත් හැකි බැව් මෙයින් පෙනේ.



මහව ගොවිකම් උපදේශක කොට්ඨාශයේ නව වී වගාවක් ගො. උ. ඇස්. ඕ. ඇම්. පීරිස් මහතා පරීක්ෂා කරයි.

මෙම ක්‍රමයේ සාර්ථකත්වය රඳා පවත්නා ප්‍රධාන කරුණු කීපයකි. වැසි ජල බලාපොරොත්තුවෙන් නියම දිනවලදී කැකුලන් ක්‍රමයට වී ඉසීම ඉතාමත් වැදගත්ය. මේ සඳහා විශේෂ උපකරණ දෙකක් පාවිච්චි කෙරේ. ගවයින් ලවා ක්‍රියා කරවනු ලබන පිලිපීන උපකරණ දෙකක් වන "ලිනාවෝ" නම් උපකරණය වී වැපුරූ ඉඩමේ පේලි ඇති කිරීම සඳහාත් "කැල්මට්" නම් උපකරණ වී වැසීමටත් උපයෝගී කරගනු ලැබේ. මනා ලෙස වල් මර්දනය කිරීම අනෙක් වැදගත් කාර්යයයි. එය වල් නාශක යෙදීමෙන් හෝ අතින් කළ හැකිය. මේ හැර හොඳ වී වර්ගයක් වගා කිරීම, කෘමි හා රෝග මර්දනය ආදියද සාර්ථක වගාවක් සඳහා අවශ්‍යවේ.

මෙම ක්‍රමය දැනට සාර්ථක ලෙස ක්‍රියාත්මක වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් කීප දෙනෙක් හඳුන්වා දෙනු කැමැත්තෙමු. 1972/73 මහ කන්නයේදී ඉබ්බාගමුව කෘෂිකම් උපදේශක ලියෝ නානායක්කාර මහතාගේ උපදෙස් පිට ගොවි මහතුන් දෙදෙනෙක් වගාව අරඹා ඇත. ඒ අතුරින් ඉබ්බාගමුව බාරොන් කුරේ මහතා හා සාම විනිසුරු පොඩි රාළහාමි මහතාද අක්. 1/2 ක් පමණ වූ කුඹුරු බිම් කොටස්වල වගා කරන



4—කේ 21315 (4/73)



පොල්පිතිගම ගො. උ. ඩී. ආර්. පී. බණ්ඩාර මහතා තම කොටසේ නව ක්‍රමය යටතේ වගා කරන ලද කුඹුරක දී ගොවිමහතුන් සමග සාකච්ඡා කරයි.

ඉබ්බාගමුව ගො. උ. ලියෝ නානායක්කාර මහතා තම කොට්ඨාශයේ මේ ක්‍රමයට වී ගොවිතැන් කළ ගොවි මහතුන් සමග.

ලද බීජ 34-8 වගාවන් ඉතාමත් සාර්ථක ලෙස වැඩී ඇත. මෙම වගා ක්‍රමය යටතේ ලබන කන්නයේ මෙම ගො. උ. කොට්ඨාශය තුළ අක්කර 25 ක් පමණ වගා කළ හැකි වනු ඇතැයි නානායක්කාර මහතාගේ අදහසයි.

තවත් මෙවැනිම වගාවන් කීපයක් මහව ගො. උ., ඇස්. ඕ. ඇම්. පීරිස් හා පොල්පිතිගම ගො. උ., ඩී. ආර්. පී. බණ්ඩාර යන මහතුන්ගේ උපදෙස් පරිදී වගාකර ඇති අතර, එම වගාවන්ද ඉතාමත් සාර්ථක වී ඇත. මහව ගො. උ. කොට්ඨාශය තුළ ද 1973 දී මේ ප්‍රමාණය අක්කර 15 දක්වා නැංවීමට අදහස් කරන බැව් ගො. උ. පීරිස් මහතා සඳහන් කරයි.

මෙම සියලුම කොට්ඨාශවල මෙම නව ගොවිතැන් ක්‍රමය ගොවිකම් දෙපාතර්මේන්තුවත් ගොවිජනතාවත් අතිනත බැඳගත් ඒකාබද්ධ වැඩ පිළිවෙලක් හැටියට ඉතාමත් සාර්ථක ලෙස ක්‍රියාත්මකවේ. ඒ නිසාම මෙතරම් කෙටි කලකින් උසස් ප්‍රතිඵල ගැනුමට හැකිවී ඇත. මෙම කුඹුරු නැරඹීමට මෑතදී ගිය පෝඩ් පදනමේ ලංකා නියෝජිත විලියම් ජී. ගෝල්ඩන් මහතාගේ විශේෂ පැසසුමටද මෙම නව වගා ක්‍රමය ලක්වී ඇත.

මෙම ක්‍රමය භාරව මූලිකව කටයුතු කරන නිලධාරීන් කීප දෙනෙකි. මේ පිළිබඳව මුලින්ම අදහසක් ඉදිරිපත් කළ, කෘෂිකර්ම නිලධාරි ඩී. ඩබ්. සිරිනායක මහතා ඇතුළු පේරාදෙණියේ සේවා සංස්කරණ අභ්‍යාස මධ්‍යස්ථානයේ නිලධාරි මඩුල්ලත්, ඒ සඳහා සහයෝගයෙන් කටයුතු කරන කුරුණෑගල දි. කෘ. ව්‍යා. නි., වී. අබේවර්ණ හා මෑතලේ දී. කෘ. ව්‍යා. නි. සී. බී. අළුවිහාරේ යන මහතුන් ඇතුළු ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරීනුත් ඒ අතර මුල් තැනක් ගනිති. මේ පිළිබඳව සියකැමැත්තෙන්ම ඉදිරිපත් වූ මෙම දිස්ත්‍රික්ක වල ගොවි මහතුන්ට දෙපාතීමේන්තුවේ ගෞරවය හිමි වෙයි.

මේ මෙම නව ගොවිතැන් ක්‍රමය පිළිබඳ හැඳින්වීමක් පමණී. ඉදිරි කාලයේදී ලබා ගන්නා ප්‍රතිඵල අනුව වැඩි විස්තර ලබන කලාප වලින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමු. 1973 නිෂ්පාදන වර්ෂයේදී මෙරට වී අස්වැන්න නැංවීමෙහි ලා මෙම නව ගොවිතැන් ක්‍රමය බොහෝදුරට ඉවහල් වන බවට කිසිදු සැකයක් නැත.

### "හෙළ රජු ඔබයි"

විජය පැරකුම් ගැමුණු මහසෙන් දිනේ සිට හෙළ ගොවිපි යා
මෙරට පමණක් නොවේ පිටරට තෙක්ම රන් දහඩිය ගි යා
වැවේ ඇතින් බලයි හිනැහී පියානනි ඔබෙ ගුණ ග යා
කොතන සිටියත් කෙසේ සිටියත් ඔබයි අගරජ ගොවිපි යා

නිවන්නට කුස ගින්න ලක්මව දහඅතේ ඇඟලුවා ඔබ දැ ක
කළේ අදිටන් බැරිව ඉවසුම් පුරුදු දැතින් ගෙනඋදැල්ල ක
එදා ගොවියෙක් කොත්මලේ සිට රජ කරන්නට ගියේ සිරිල ක
අදත් වැජඹෙයි රජකමට වැඩි සක් දෙව්ඳු තනතුරෙත් නෑ සෑ කි

පැල්වෙහෙර කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලයේ, සරත් ධම්සිරි එදිරිසිංහ ගෙනි.